**එක්සත් සමාජවාදී පක්ෂය**
**ஐக்கிய சோசலிச கட்சி**
**UNITED SOCIALIST PARTY**
Sri lanka section of the
committee for a worker's international (CWI)

★ 53/6 ඊ.ඩී. දබරේ මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන : 011 2504647

★ 53-6 ஈ.டி.தாபரேமாவத்தை,
நாராஹென்பிட்டி,கோலம்பு 05.

**හිතවත් සහෝදරය, සහෝදරිය, මහත්මයානෙනි,**

**සියලු දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති සහ ක්‍රියාකාරීන් වෙත,**

ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරන සියලූ දෙනා වෙත කරනු ලබන ආයාචනයයි. ලංකාවේ ආණ්ඩුව මෑතක දී ත්‍රස්තවාදයට එරෙහි පනත් කෙටුම්පත නමින් ඉතාම කුරිරු නීතියක් හඳුන්වා දී ඇත. පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කිරීම සඳහා පසුගිය කාලය පුරා ලංකාව තුළ සහ ජාත්‍යන්තර වශයෙන් බරපතල සැලකිය යුතු විරෝධයකට සියලු ආණ්ඩු වලට මුහුණ දීමට සිදුවිය. දැන් එය අහෝසි කරන බව පෙන්වමින් ඉතිහාසයේ පෙර නොතිබූ අයුරින් ඊටත් වඩා කුරිරු හා ප්‍රජාතන්ත්‍ර විරෝධී නීතියක් ආදේශ කරමින් වත්මන් රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව මහජනතාව හා ජාත්‍යන්තරය රැවටීමට කටයුතු කරමින් සිටි. අපි සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ දේශපාලන හා වෘත්තීය සමිති ක්‍රියාකාරීන් මෙන්ම මාධ්‍යවේදීන් ඇතුළු පොදුජනතාව ත්‍රස්තවාදීන් ලෙස හන්වඩු ගසා මර්ධනය කිරීමට අවශ්‍ය පසුබිම සකසන මේ කුරිරු නීතියට එරෙහිව එය පරාජය කිරීම සඳහා ආණ්ඩු විරෝධී සියළු බලවේග ඒකාබද්ධ ක්‍රියාවන් සඳහා ඉදිරියට පැමිණෙන ලෙසය.

පහත සඳහන් ඉල්ලීම් සඳහා අවම වශයෙන් ඔබගේ විරෝධය දැක්වීමට ඉදිරිපත් වන ලෙස අපි සියලු සංවිධාන සහ ක්‍රියාකාරීන්ගෙන් ඉල්ලා සිටිමු.

★ ජනතාවගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අහෝසි කරන ත්‍රස්ත විරෝධී පනත වහාම අහෝසි කරනු.

★ කතා කිරීමේ නිදහස හා රැස්වීමේ අයිතිය සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඇතුලු ප්‍රජාතන්ත්‍රවාදී නිදහස අකුලා දැමීමට ඉඩ නොදෙමු.

★ ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්වීමට එරෙහිව දියත් කර තිබෙන මෙම දුෂ්ට ප්‍රහාරයට එරෙහිව පුළුල් මහජන ව්‍යාපාරයක් ගොඩනැගීම ආරම්භ කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී විරෝධතා දිනයක් සංවිධානය කරන ලෙස අපි සියලූ දේශපාලන පක්ෂ, වෘත්තිය සමිති හා වෙනත් ක්‍රියාකාරී සංවිධානවලින් ඉල්ලා සිටිමු.

★ ජාත්‍යන්තර සංවිධාන සහ එම ආණ්ඩු විසින් මෙම කුරිරු නීතියට විරුද්ධව වහා පියවර ගත යුතු බව අපි අවධාරණය කරන්නෙමු.

★ රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවේ මෙම මිලේච්ඡ හා මර්ධනකාරී උත්සාහයන් හෙළා දකින ලෙසත් ඊට එරෙහි වීමට පියවර ගන්නා ලෙසත් ලොව පුරා සිටින සියලුම මානව හිමිකම් සංවිධාන සහ වෘත්තීය සමිතිවලින් අපි ඉල්ලා සිටිමු.

මෙම ඉල්ලීම් සඳහා (හෝ අවම වශයෙන් මෙම ඉල්ලීම්වල කොටසක් වෙනුවෙන්) ඔබගේ සහයෝගය සහතික කරන මෙන් ඔබ සැමගෙන් අප ඉල්ලා සිටින අතර ප්‍රජාතන්ත්‍රවාදයට මානව අයිතීන්ට සහ නිදහසට එල්ල කෙරෙන ඉතිහාසයේ දරුණුතම ප්‍රහාරයට එරෙහිව එක්ව නැගී සිටීමට පියවර ගන්නා ලෙස ඔබගෙන් ඉල්ලා සිටිමු.

මෙයට හිතවත්,

**සිරිතුංග ජයසූරිය**
ප්‍රධාන ලේකම්
2023-04-06